**මිල්ලනිය ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ජේද අංක 3.27 සිට 3.32 දක්වා සඳහන් ඡේද ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අතිරික්තයට සිදු කළ යුතු ගැලපුම් නිවැරදිව කර නොතිබු අතර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.531,808 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද රු.6,171,987 ක් වූ ව්‍යාපෘති 08 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්,පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වරද නිවැරදි කිරීමට කටයුතු කරන ලද බව. | පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදි නිවැරදිව ගිණුම්ගත කරන ලද ලෙනවර ක්‍රිඩා පිටිය හා පාතකඩ ළමා ක්‍රිඩාංගනය වටා දැල් වැටවල් ඉදි කිරීම සඳහා ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එකතුව රු.2,461,669 ක් සමාලෝචිත වර්ෂයේ ජර්නල් අංක 06 සහ 08 මගින් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැරදි ලෙස ගිණුම් තැබීම නිවැරදි කර ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස පාතකඩ ළමා ක්‍රිඩාංගනය සංවර්ධනය කිරිම සඳහා ලද රු.1,999,993 ක් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | -එම- |
| (ඈ) | ආයුර්වේද ගොඩනැගිල්ලේ සහ පුස්තකාල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරිමට 2022 ජනවාරි මාසයේදී ඇස්තමේන්තු කරන ලද රු.550,000 ක් අළුත්වැඩියා කටයුතු සිදු කිරිමෙන් තොරව වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | වියදම් දැරීම නිශ්චිතව හඳුනාගෙන උපචිත කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේ දී ලැබී තිබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වත්කම්වල ක්ෂය ප්‍රමාණය රු.487,060 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂය සඳහා බඳුන් හා උපකරණ ක්ෂය රු.415,785 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | - එම - | නිවැරදි අගයන් අවසන් ගිණුම්වලට ගැලපිය යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ | | | |
| (i) 127 වගන්තිය. | සභා බල ප්‍රදේශය තුළ පවතින සුසානභූමි 26 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022.06.21 කළුතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත මුදල් ගෙවා ඇතත් මෙතෙක් එම මිණුම් කටයුත්ත කර නැත. මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් විසින් වරින්වර සිහි කැඳවීම් යවා ඇති බව | මිණුම් කටයුතු කඩිනමින් අවසන් කර සුසානභූමි සභාව වෙත පවරාගත යුතුය. |
| (ii) 154 වගන්තිය. | සභා බල ප්‍රදේශය තුල වෙන්දේසි කර විකුණනු ලබන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට 01 ක බද්දක් සභාව විසින් අයකළ යුතු වුවත්, එයට පටහැනිව ඉඩම්වල තක්සේරු වටිනාකම පදනම් කර ගෙන බදු අය කර තිබුණි. | ගෙවීම් පදනම මත ඉඩම් විකිණීම නිසා විකුණුම් වටිනාකම දැන ගැනීමට දීර්ඝ කාලයක් ගතවේ. එම නිසා තක්සේරු නිලධාරීන්ගේ වාර්තාව පදනම් කර 1% බදු මුදල් අය කර ඇති බව | ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.6,637,183 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.14,564,922 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,197,440 | 4,433,669 | 4,366,325 | 67,345 | 2,087,100 | 3,542,376 | 3,399,033 | 143,343 |
| (ii) | කුලී | 402,000 | 218,362 | 218,362 | - | 502,000 | 333,886 | - | 402,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,379,050 | 344,090 | 339,590 | 4,500 | 416,300 | 416,300 | 492,610 | 444,610 |
| (iv) | වෙනත් ආදායම් | 39,661,100 | 37,296,591 | 32,847,465 | 4,449,126 | 33,916,800 | 32,643,437 | 19,945,614 | 12,697,823 |
| | | 44,639,590 | 42,292,712 | 37,771,742 | 4,520,971 | 36,922,200 | 36,935,999 | 23,837,257 | 13,687,776 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,132,028 ක් හා මුද්දර ගාස්තු රු.11,638,539 ක් විය. | උපලේඛන සකස් කර 2022.12.31 ට පෙර අදාල ආයතන වෙත යවා ඇති අතර 2023 මැයි 01 වන විට රු.6,885,193 ක් ලැබී ඇත. 2021 වර්ෂයට අදාල රු.1,005,000 ක උපලේඛන භාර දී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් මස රු.803,900 ක් වැය කර ස්ථාපනය කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 03 න්, 2023 මැයි 10 වන විටද කිසිඳු ආදායමක් උපයාගෙන නොතිබුණි. | දැන්වීම් පුවරු අලෙවි කර ගැනීම සඳහා ආයතන කිහිපයක් සමඟ සාකච්ජා කරමින් පවති. ඉදිරියේදී හැකි ඉක්මනින් එම පුවරු අලෙවි කිරිමට බලාපොරොත්තු වන බව. | පුවරු අලෙවිය කඩිනම් කර ආදායම් පූර්ණය කඩිනම් කළ යුතුය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදි කර ගැනීමට කටයුතු කරන අතර දැනට එය සකසමින් පවතින බව. | සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන විෂය ක්ෂේත්‍ර 12 ක් ඇතුලත් කර අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබුණද, එම සැලැස්ම මගින් අපේක්ෂිත විගණන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබූ අතර වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා 04 ක් පමණක් නිකුත් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුය. |